# සිංහල බෞද්ධයාට කුඩම්මාගේ සැලකිලි

③



මාක්ස්, ලෙනින්වාදී අන්තයෙන්ද, ලිබරල්වාදී අන්තයෙන්ද මිදී, දම්පල් තුමන් ගත් හෙළ බොදු මගට පිවිසි <u>ලොකුසතු හේවා මෙත්තානන්ද</u> හෙවත් <u>එල්.එච්. මෙත්තානන්ද මහාසයාණො</u> 1956 පෙබරවාරි 4දා අනඳ විදුහලේදී එළිදැක්වූ බෞද්ධ කමිටු වාර්තාව සඳහා අප්‍රමාණ මෙහෙවරක් කළහ. එසේම, එහි අධ්‍යාපනය සම්බන්ධ කොටසෙහි රචකයාණෝද වෙති. සිංහල බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් මහත් මෙහෙවරක් කළ එතුමාණෝ ක්‍රිස්තියානි මූලධර්මවාදයට හා දෙමළ බෙදුම්වාදයට එරෙහිව පැහැදිලි හඬක් හා වැඩපිළිවෙලක් ගොඩනැගූ ජාතික වීරයෙකි.!

## 05. බෞද්ධ දුප්පතුන් මුදලට ගැනිම

අනාථ වූ,අසරණ වූ, දිළිඳු වූ, කොටින් කියතොත් ආර්ථික තත්වයෙන් පහත් වූ අයවුලුන්ට කතෝලික පූජකයා මෙසේ කියයි.

මුදල් දෙන්නා - කතෝලික වෙයන්
ආහාර දෙන්නා - කතෝලික වෙයන්
රක්‍ෂාව දෙන්නා - කතෝලික වෙයන්
ඉඩමක් දෙන්නා - කතෝලික වෙයන්

පරෝපකාරය මගින් කතෝලික ආගමට බෞද්ධ අසරණයින් හරවා ගැනිම මිනිස්කමට නොහොබී. එය අධම ක්‍රියාවකි. එක්තරා බෞද්ධ ගමක දුප්පත් බෞද්ධ ස්ත්‍රියෙකුට කතෝලික වීමේ පොරොන්දුව පිට රුපියල් හයක් කතෝලික පූජකයෙක් දුන්නේය. ඊට තම පවුල භේද භින්න විය.

තම සැමියාද දරුවන් දෙදෙනා ද ඊට විරුද්ධ වූහ. මිලේච්ඡයන් වුවද, වැද්දන් වුවද, කිසිම බලාපොරොත්තුවක් නොමැතිව ආගන්තුක සත්කාරය කරනවා නොවෙද? ඉඩෝරය නිසා සාගින්නේ පෙළුණු වන්නියේ ජනයාට ලංකාවේ නොයෙක් පලාත්වල බෞද්ධ පින්වතුන් ආහාර, වස්ත්‍ර, මුදල් යනාදිය රැගෙන ගොස් බෙදා දුන්නේ කිසිම කොන්දේසියක් පිටද? නොඑසේය, ඉතසිතින්මය. මහජනයා හෝ රජය විසින් පටන්ගන්නා වන්නි සේවය පරෝපකාර වැඩපිළිවෙලකට රෝමානු කතෝලික සභාව කිසිසේත් සහභාගි වන්නේ නැත. ඒ මන්ද? එවැනි වැඩකින් බෞද්ධයන් රෝමානු කතෝලික කරගන්ට ඉඩ නොලැබෙන නිසයි. පොදු ජනතාවගේ ආර්ථික තත්වය දියුණු කිරිම රජයට භාර වගකීමකි. පරෝපකාරය පිණිස යමෙක් ඉදිරිපත් වුවහොත් ඒ පිණිසම එය කළ යුතුයි. නොඑසේ නම් එය තිරිසන්කමකි. විදේශි ආණ්ඩුවක් හෝ විදේශි ආයතනයක් හෝ සමාජ සේවාවලට උදව් දීමට කැමති වුවහොත් ඒ උදව් රජයට රුචි වූ පරිද්දෙන් පාවිච්චි කිරිමට රජයටම භාරදිය යුතුය. නැත්තම් එයින් සිදුවන්නේ රටේ ඔත්තුකාර පිරිසක් බිහිකිරිමකි.

## 06. බෞද්ධ අනාථ දරුවන් වහලුන් කිරිම

කතෝලික අනාථ නිවාසවලට ඇතුල්වෙන බෞද්ධ පිරිමි හෝ ගැහැණු ළමයි බොහොමයක් ඒවායින් පිටවන්නේ කතෝලික ධනවතුන්ගේ වහලුන් හැටියටයි. මේ වහල් ජාවාරමට යන වියදම ලබාගන්නේ රජයෙනි. අනාථ දරුවන්ගේ නීත්‍යානුකූල භාරකාරයා රජයයි. එම නිසා අනාථ නිවාස රජයම පාලනය කලයුතුය. බෞද්ධ අනාථ දරුවන්ගේ සොයා බැලිමට කතෝලික සභාවට කොන්ත්‍රාත් දුන්නොත් එයින් බුද්ධාගමට විරුද්ධ වූ. ජාතියට විරුද්ධ වූ, පරදේශක්කාරයින්ට පක්‍ෂ වූ හතුරු හමුදාවක් රට ඇතුළෙන් මහජන මුදලින්ම පැන නගිනවා ඇත. එය නරියාට බොක්ක හෝදන්නට දුන්නා වැනිය.

සමහර බෞද්ධ ගම්වල කතෝලික රහස් ව්‍යපාර ගෙනයන්නේ මෙසේයඃ එක්තරා යාබද ගම් දෙකකි. ඒ ගම් දෙකේ ඉඩම් වැඩිහරියක් දූන් අයිතිව තිබෙන්නේ රෝමානු කතෝලිකයින්ටයි. ඒ ගම් දෙකේ ඉඩම් වැඩි හරියක් දූන් අයිතිව තිබෙන්නේ රෝමානු කතෝලිකයන්ටයි. ඒ ගම් ගැන දන්නා තිබේ. මේ ගමින් පළමුවෙන්ම ආගමට ගිය මහතා ඒ පල්ලියේ භාරකාරකම දි පඩිද තවත් යම් යම් උදව්ද ස්වාමිවරුන් කරන බැව් කරන බැව් ඒ මහත්වරු ගමේ ප්‍රචාරය කළේය. අවුරුද්දකට හයමාසයකට වරක් ඒ පවුල් වලට රෙදිපිලි ආදියෙන් සංග්‍රහ කළේය. මේවා බොහෝ ලොකුවට ගමේ ප්‍රසිද්ධ කළෝය.

තවද ගමේ රක්‍ෂාවක් නැතිව සිටින අයවලුන් යම් යම් නඩුපනත් වලට අසුවූ විට කුරුණෑගල රෝමානු ආගම්කාර පෙරකදෝරු මහත්වරුන් නොමිලයේ නඩුවලට ඉදිරිපත්වෙන බැව් ගමේ ප්‍රසිද්ධ කරන්නට පටන් ගත්හ.

වතුවල සිටින රෝමානු කතෝලික වතු සුපිරින්ටැන්ඩන්ට් මහත්වරු බුද්ධාගම්කාරයින්ටත් කුලි වැඩදිම නතර කරන ලදි. ආගමට ගියොත් කුලි වැඩ දෙන්ට සලස්වන බැව් ඉහත කී රෝමානු පවුල්වල මහතුන් ගමේ ප්‍රසිද්ධ කරන ලදි.

පින්වතෙක් මට මෙසේ කියයි.''දුප්පත්කම නිසා ඒ ඒ අයගේ වුවමනාවන් පිරිමසා ගැනිමට මෙගම්වාසීහු ඉහත කී කතෝලිකයන්ට ඉඩකඩම් විකුණති.'' ස්වාමිවරුන්ද මේ අවට වතුවල සිටින රෝමානු කතෝලික වතු සුපිරින්ටැන්ඩන්ට් මහතුන්ද මේ අලුතෙන් බැඳුනු රෝමානු පවුල්වල අයට නොයෙක් අයුරින් උදව් උපකාර කරන්නට පටන් ගත්හ.

තමන්ගේ දරුවන් මඩම්, රෝමානු විද්‍යාලට ඇතුළත් කර නොමිලයේ උගන්වන බැව් ප්‍රචාරය කරන ලදි. රෝමානු ආගම්කාර මහතුන්ට අයිති ඉඩම්වල කුලිවැඩ දීමට නම් රෝමානු ආගමට බැඳිය යුතුවිය. එපමණක් නොව ඒ වතුවල හරකුන් බැඳිමට නම් ආගමට යා වුතු විය. වතුවලට අයිති කුඹුරු ගමේ තිබේ නම් ඒවා වැඩ කිරිමට නම් ආගමට යන්නට ඕනෑ විය. මේ හැම සහනයක්ම ඇතිවෙන්නේ රෝමානු කාරයින්ට පමණය.

මේ අතර රෝමානු ආගම්කාර වතු හිමියකුගේ ඉඩමක් පල්ලියක් සාදාගැනිමට තෑගි කරන ලදි. මේ ඉඩමේ දූන් තාවකාලික පල්ලියක් තනා

## 07. බෞද්ධ හා රජයේ පාසල් වැනසීම.

බෞද්ධ ගම් කතෝලික කිරිමට රෝමානු කතෝලික සභාව බලවත් සටනක් කරයි. අලුතෙන් පටන් ගන්ට යන බෞද්ධ පාසල්වලට හරස් කපයි. රජයේ පාසල් නැති කිරිමට උගුල් අටවයි. එකම කතෝලිකයෙක්වත් නැති තැන්වල ඉඩම් හොර රහසේ ලබාගෙන පල්ලි සාදන්නට හා පාසල් සාදන්නට සූදානම් වෙයි. එක්තරා බෞද්ධ ගමක පාසලක් හදන්නට තෝරාගත් ඉඩමක් වටිනාකමකට වඩා වටිනාකමට වඩා වැඩි මුදලක් දි මිලයට ගත්තේය. තවත් බෞද්ධ ගමක රජයේ පාසලට යාබදව ඉඩම් මිලයට ගෙන එහි කතෝලික පාසලක් තනා එය ලියාපදිංචි කරවාගෙන රජයේ පාසල වස්වා ගැනිමට කුමන්ත්‍රණය කරයි. තවත් බෞද්ධ ගමක අලුතෙන් පටන්ගත් කතෝලික පාසලක් ලියාපදිංචි කිරිමට කතෝලික ළමුන් තිස් දෙනෙක් වුවමනා නිසා බෞද්ධ ළමයින්ට සීනිබෝල, තෑගිබෝග දි ඔවුන් කතෝලික ආගමට හරවා ගත්තේය. එයට ඔවුන්ගේ දෙමව්පියෝ කිපුණාහ. මේ උදවිය රැකි රක්‍ෂාව නැති දුප්පත් අයයි. එමනිසා ඔවුන් කරා කතෝලික පූජකයා ගොස් ඔවුන්ගෙන් සමහරෙකුට ආහාර පානාදියද දී රවටාගෙන ඔවුන්ද කතෝලික ආගමට හරවා ගත්තේය.

රෝමානු කතෝලික සභාව ස්වකීය පාසල් වැඩිකර ගැනිමට යොදා තිබෙන අලුත් උපායක් මෙයයි. දනට ඇති පාසලක අංශයක් වෙන දිහාවකට ගෙන යනවාය කියා ගෙනගියායින් පසු එය අලුත් පාසලක් හැටියට ලියාපදිංචි කරවාගෙන ලියාපදිංචි පාසල් දෙකක් ඇති කර ගැනිමයි. ඒ උපාය සාර්ථක කළ හැකිවන්නේ කුමන්ත්‍රණයකින් පසුවය. මේ කුමන්ත්‍රණයට කතෝලික කතෝලික සභාව සමඟ වරක් එක්වුයේ කතෝලික පාසල් පරික්‍ෂක තැන හා පාසල සම්බන්ධ වූ අධ්‍යාපන මහා කාර්යාලයේ කතෝලික නිලධාරි තැන යන තුන්දෙනාය. මේ කතෝලික තුන් යාළුවෝ එක්තරා කතෝලික පාසලක කොටසක් එකම කතෝලිකයෙක්වත් නැති හැතැප්මක් පමණ ඈත තැනකට ගෙනයාමට අවසර දුන්හ. ඊට පසු ඒ කොටස අලුත් පාසලක් මෙන් ලියාපදිංචි කරන ලදි. මේ හොරකම සඟවා තැබිම පිණිස ඒ පිළිබඳ ලියවිලි එකම මිටියක තබනවා වෙනුවට මිටි හතරකට දමා වෙන් කරන ලදි. බෞද්ධයා කැළඹිණ. බෞද්ධ විරෝධය නිසා කථෝලික තුන් යහළුවන් විසින් කතෝපික සභාවට දුන් අවසරය අවලංගු කරන ලදී.

තවද කතෝලික පාසල් ගැන විරෝධය දක්වා එවන සාමාන්‍ය ලියවිලි කතෝලික ලිපිකරුවෝ ඒවා කුණු කුඩයට විසිකරති. ලියාපදිංචි කරන ලද ලියු නම් විසිනොකර සඟවා තබති.

කතෝලික පාසලකට පැමිණෙන බෞද්ධ ළමයින්ගේ සංඛ්‍යාව වැඩිකර ගැනීම පිණිස පිණිස කරන අයතා ක්‍රියාවක් නම්-ජේෂ්ඨ විභාගයෙන් සමර්ථ වූ කතෝලික වෙන්ට කැමති බෞද්ධ ළමයින්ට රක්ෂාදී කතෝලික අභ්‍යාස විද්‍යාලයකට දනුම අඩු වුවත් ඇතුල් කරවා ගැනීමයි. ඔවුන් පෙනී සිටින්නේ කතෝලික හැටියට වුවත් ඔවුන්ගේ උප්පැන්න සහතික වලින් බෞද්ධ බව ඔප්පු වේ. අභ්‍යාස විද්‍යාලවලට වියදම සහජන මුදලින් ගෙවනබව දත යුතුයි. රෝමානු කතෝලික සභාවේ හිතුවක්කාරකම සීමාන්තිකය. රජයේ පොහෝ නිවාඩු දිනවල සමහර කතෝලික පාසල් නොවසතු ලැබේ මෙය රජයේ නීති කැඩීමක් නොවන්නේද?

නොබෝදා දූනගහ නම් බෞද්ධ ගමේ බෞද්ධ ජනතාවගේ වාරුද්ධත්වය දක්වද්දී රෝමානු කතෝලික පාසලක්ද තනන්නට මාන බලයි. ගිය අවුරුද්දේ ඇතිවුණ බෞද්ධයින්ගේ උග්‍ර විරෝධිය නොතකා මරදානේ ඩීන්ස් රෝඩ් මාවතෙහි විශාල පල්ලියක් දූන් ගොඩනගාගෙන යයි. එහි අවට දූන් පදිංචිව සිටින බෞද්ධයින් පන්නා දමා කතෝලිකයින් පදිංචි කරවා ගැනිම පණිස පල්ලිය වටේ ඉඩම් හා ගෙවල් රෝමානු කතෝලික සභාව වටිනාකමටත් වඩා මුදල් දි මිලයට ගනියි. මේ ජාති විරෝධි වැඩවලට රජයද නිසොල්මන්ව සිටින බව පෙනේ. වැල්ලවත්තේ පල්ලියකට යන පාර පළල්කොට අලංකාර ලෙස රජයේ වියදමින් සාදා තිබේ. එසේ වුවත් අවුරුදු ගණනාවක් තිස්සේ පළල් කරන්නට යයි බෞද්ධයා මුරගා කිව් ආනන්ද මහා විද්‍යාලය ඉදිරිපිට ඇති ට්‍රොලියන පටු පාර තවම එසේමය.

කුමන්ත්‍රණ මගින් හොඳ ඉඩම් අල්ලා ගැනිමට රෝමානු කතෝලික සභාව හරි හපන්ය. කොළඹ ඉතාම රම්‍ය වූ පෙදෙසක පිහිටි ලක්‍ෂ දෙකහාමාරක් පමණ වටිනා වූ ඉඩමකට අවුරුදු ගණනාවක් තිස්සේ රෝමානු කතෝලික බිෂොප්තුමා ඇස ගසාගෙන සිටියේය. එය අයිතිව තිබෙන්නේ බෞද්ධයෙකුටය.

<u>ලබන කලාපයට</u>

